00001

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

5 වන මට්ටම - 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝ විද්‍යාව - SNU5535/ESU3235

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.10.21 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

I වන කොටස

01. අන්තර්කරණ පන්ති කාමරයක ගුරුවරයෙකුට "අධ්‍යාපනික මනෝ විද්‍යාවේ" වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා අධ්‍යයන ක්‍රමයක් ලෙස ප්‍රශ්නාවලිය ක්‍රමයේ ශක්තීන් දෙකක් (02) සහ දුර්වලතා දෙකක් (02) සඳහන් කරන්න.

03. උදාහරණ දෙකක් (02) දක්වමින් "වර්ධනය" සහ "සංවර්ධනය" අතර වෙනස පැහැදිලි කරන්න.

04. දරුවෙකුගේ වර්ධනයට සහ සංවර්ධනයට බලපාන සාධක දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ සෞඛ්‍ය සම්පන්න පෞරුෂයක් ගොඩනැගීම සඳහා පදනම දැමීමේ දී දෙමාපියන්ගේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්තවේගීය වර්ධනය සම්බන්ධයෙන් ගුරුවරයාගේ කාර්යභාරය කුමක් ද? උදාහරණ තුනක් (03) මගින් පැහැදිලි කරන්න.

07. මාග්‍රට් මීඩ්ගේ සංස්කෘතික ඉගෙනුම් න්‍යාය මත පදනම් ව විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනීමට පහසුකම් සැලසීමට යොදා ගත හැකි උපාය මාර්ග දෙකක් (02) සාකච්ඡා කරන්න. ඔබේ අදහසට සහාය වීම සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.

08. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මතකය වැඩි දියුණු කිරීම සඳහා ශිල්පීය ක්‍රම භාවිත කිරීමේ දී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) "සමබර පෞරුෂය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ සමබර පෞරුෂය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඕනෑම පෞරුෂත්ව න්‍යායකට අනුකූලව විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ සමබර පෞරුෂයක් ගොඩනැගීමට පහසුකම් සැලසීම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි උපාය මාර්ග හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. (i) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා උගන්වන ගුරුවරයෙකුට ඉගෙනුම් න්‍යායන් පිළිබඳ හැදෑරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඕනෑම ඉගෙනුම් න්‍යායක් තෝරාගෙන අවම වශයෙන් එහි මූලික මූලධර්ම තුනක් **(03)** ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉහත සඳහන් මූලධර්ම භාවිතා කිරීම පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) උදාහරණ දෙකක් **(02)** උපුටා දක්වමින් අභ්‍යන්තර පෙළඹීම සහ බාහිර පෙළඹීම වෙන් කොට දක්වන්න. (ලකුණු 06)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනය සඳහා අභ්‍යන්තර පෙළඹීමෙහි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) මාස්ලෝගේ න්‍යායට අනුකූලව ඉගෙනීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ පෙළඹීම ඉහළ නැංවීම සඳහා ගුරුවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) "තොරතුරු සැකසුම් ආකෘතිය" සහ එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සුදුසු උදාහරණ සපයමින් කෙටි කාලීන මතකය සහ දිගු කාලීන මතකය වෙන්කොට දක්වන්න. (ලකුණු 04)

(iii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මතකය වැඩි දියුණු කිරීම සඳහා යොදාගත හැකි ශිල්පීය ක්‍රම හයක් **(06)** සාකච්ඡා කරන්න. (ලකුණු 12)

13. (i) නව යොවුන් වියේ වර්ධනය හා සම්බන්ධ ලක්ෂණ හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) 'නව යොවුන් විය', කුණාටු සහ ආතතිය සහිත කාල පරිච්ඡේදයක් ලෙස හැඳින්වේ. ඊට හේතුව එම කාලපරිච්ඡේදය තුළ නව යෞවනයන් විවිධ ගැටළු හා දුෂ්කරතා වලට මුහුණ දීමයි.

විශේෂ අවශ්‍යතා සහිත නව යොවුන් වියේ දරුවන් මුහුණ දෙන එවැනි ගැටලු සහ දුෂ්කරතා පහක් (05) සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) විශේෂ අවශ්‍යතා සහිත නව යොවුන් වියේ දරුවන්ට ගැටලු සහ දුෂ්කරතා අවම කර ගැනීමට කැප වූ ගුරුවරයෙකුගේ සහාය අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලියට ඔබගේ මැදිහත්වීම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. (i) පර්යේෂණාත්මක සහ පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රම අතර වෙනස්කම් තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඔබට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවකුගේ හැසිරීම නිරීක්ෂණය කිරීමට අවශ්‍ය බව සිතන්න.

a). ඉහත කාර්යය ඉටු කිරීම සඳහා සුදුසු ළමා අධ්‍යයන ක්‍රම තුනක් (03) නම් කරන්න.

b). ඉහත සඳහන් කළ ළමා අධ්‍යයන ක්‍රමවලින් එකක් තෝරාගෙන දරුවාගේ හැසිරීම පිළිබඳ විශ්වාසදායක සහ වලංගු තොරතුරු රැස් කිරීම සඳහා ඔබ එම ක්‍රමය භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(iii) ඉහත තෝරාගත් ළමා අධ්‍යයන ක්‍රමයෙහි සීමාවන් තුනක් (03) සාකච්ඡා කර ඒවා ජය ගැනීමට එක් (01) උපාය මාර්ගය බැගින් සඳහන් කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.